සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

92 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

**විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (සිංහල) I, II**
மின் ஆவணப்படுத்தலும் சுருக்கெழுத்தும் (சிங்களம்) I, II
Electronic Writing and Shorthand (Sinhala) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (සිංහල) I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන වරණ අතුරෙන් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ආයතනයක ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණය දක්වා කෙරෙන අභ්‍යන්තර සන්නිවේදනයේ දී පමණක් යොදාගන්නා ලිඛිත සන්නිවේදන ක්‍රමයක් වන්නේ,
(1) චක්‍රලේඛ ලිපි ය. (2) මෙමෝ පත්‍ර ය.
(3) කෙටි පණිවුඩ ය. (4) කැඳවීම් ලිපි ය.

**2.** යතුරු ලියනය භාවිතයෙන් ලිපි ලේඛන සකසා ගැනීමේ දී භාවිත **නොකරන** ද්‍රව්‍යයක් වන්නේ,
(1) යතුරු ලිවීමේ කඩදාසි ය. (2) රෝනියෝ ස්ටෙන්සිල් ය.
(3) යතුරු ලියන රිබන් ය. (4) මුද්‍රණ තීන්ත ය.

**3.** භාණ්ඩ මිල දී ගැනීමකදී, අදාළ සැපයුම්කරු තහවුරු කර ගැනීමෙන් පසුව ඔහු වෙත ඉදිරිපත් කෙරෙන ව්‍යාපාරික ලිපිය කුමක් ද?
(1) පිරිනැමීමේ ලිපිය (2) භාණ්ඩ ඇණවුම් කිරීමේ ලිපිය
(3) ටෙන්ඩර් කැඳවීමේ ලිපිය (4) මිල පැවසීමේ ලිපිය

**4.** කාර්යාලයක සුළු මුදල් වියදම් සඳහා අනුමත කර ඇති සුළු මුදල් අග්‍රිමය රු. 5 000/= කි. 2024 ජනවාරි 1 දින සුළු මුදල් භාරකරු වෙත එම මුදල ලැබුණු අතර ජනවාරි 31 දිනට සුළු මුදල් පොතේ වියදම් එකතුව රු. 3 800/= ක් විය. 2024 පෙබරවාරි 1 දින ප්‍රතිපූරණය කළ මුදල වන්නේ,
(1) රු. 1 200/= කි. (2) රු. 3 800/= කි. (3) රු. 5 000/= කි. (4) රු. 6 200/= කි.

**5.** කාර්යාලයට ලැබෙන දුරකථන ඇමතුමක දී අනුගමනය කළ යුතු පිළිවෙතක් වන්නේ,
(1) ආයතන නාමය සඳහන් කරමින් ඇමතුම ලබා ගැනීමයි.
(2) සංවාදය නිම කිරීමෙන් පසුව අවශ්‍ය කරුණු සටහන් කර ගැනීමයි.
(3) දුරකථනය නාද වන විට ම ඇමතුම ලබා ගැනීමයි.
(4) 'හෙලෝ' යනුවෙන් අමතමින් ඇමතුම ලබා ගැනීමයි.

**6.** තුෂාරි පරිගණක යතුරු පුවරුවේ නිවැසි යතුරු පෙළ මත පහත පරිදි ඇතැගිලි හසුරුවන ලදී.
'දකුණු අත මැදැගිල්ල, දකුණු අත දබරැඟිල්ල, දකුණු අත මැදැගිල්ල, දකුණු අත දබරැඟිල්ල, වම් අත මැදැගිල්ල'
එහි දී යතුරු ලියනය වූ වචනය කුමක් ද?
(1) නවනවා (2) වනනවා (3) කවනවා (4) යවනවා

[දෙවැනි පිටුව බලන්න.

7. 'කවිය' යන වචනය යතුරු ලියනය කිරීමට පරිගණක යතුරු පුවරුවේ නිවැසි යතුරු පෙළ මත ඇතැඟිලි හැසිරවිය යුතු ආකාරය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
   (1) දකුණු අත මැදැඟිල්ල, දකුණු අත දබරැඟිල්ල, වම් අත වෙදැඟිල්ල, දකුණ අත දබරැඟිල්ල
   (2) දකුණු අත වෙදැඟිල්ල, දකුණු අත දබරැඟිල්ල, වම් අත වෙදැඟිල්ල, වම් අත දබරැඟිල්ල
   (3) දකුණු අත වෙදැඟිල්ල, දකුණු අත දබරැඟිල්ල, වම් අත වෙදැඟිල්ල, දකුණ අත දබරැඟිල්ල
   (4) දකුණු අත මැදැඟිල්ල, දකුණු අත දබරැඟිල්ල, වම් අත මැදැඟිල්ල, වම් අත දබරැඟිල්ල

8. සෑම විටම මාරු යතුර (Shift key) ද සමඟ යතුරු ලිවීම කළ යුතු වචනය කුමක් ද?
   (1) වනචාරී (2) මහෞෂධ (3) ඖෂධ (4) විශේෂ

9. යතුරු පුවරුවේ මාරු යතුර, නිවැසි යතුරු පෙළ සහ උඩ පෙළ පමණක් භාවිතයෙන් ලිවිය හැකි වාක්‍යය කුමක් ද?
   (1) රටවැසියා නීතිය අවභාවිත නොකළ යුතු ය.
   (2) උසස් අධ්‍යාපන කටයුතුවලදී ද්විභාෂා දැනුම අවශ්‍ය වේ.
   (3) කර්මාන්තවලට අවශ්‍ය ඉඩම් වෙන් කරන්න.
   (4) විවේකයට නවතම ස්ථාන නියම කර ඇත.

10. පරිගණකයේ සකස් කර තිබූ ලේඛනයක් විවෘත කර, එහි සංශෝධන කිහිපයක් කිරීමෙන් පසු යතුරු පුවරුවේ ctrl+S යතුරු සංයෝජනය එකවර ඔබන ලදි. මෙමගින් කරන ලද සියලු සංශෝධන
   (1) මැකී ලේඛනය පෙර තිබූ ස්ථානයේ ම ගබඩා වේ.
   (2) සහිතව ලේඛනය පෙර තිබූ ස්ථානයේ ම ගබඩා වේ.
   (3) සහිත පිටපතක් නව ගොනුවක් ලෙස ගබඩා වේ.
   (4) සහිතව ලේඛනය සම්පූර්ණයෙන් ම තේරේ.

11. පරිගණකයේ විවෘතව ඇති ලේඛනයකට අකුරක් හෝ රූපයක් හෝ අලුතින් එක් කර එසැනින්ම එය ඉවත් කිරීමට භාවිත කළ යුතු යතුරු සංයෝජනය කුමක් ද?
   (1) ctrl+A (2) ctrl+V (3) ctrl+Z (4) ctrl+C

12. යතුරු පුවරුවේ ඇති විශේෂිත යතුරු සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) Delete යතුර එබීම මගින් පාඨයක සැරිත්ත (cursor) ඇති ස්ථානයට වම් පසින් ඇති අකුරු මකා දැමිය හැකි ය.
   (2) Backspace යතුර එබීම මගින් පාඨයක සැරිත්ත ඇති ස්ථානයට දකුණු පසින් ඇති අකුරු මකා දැමිය හැකි ය.
   (3) තෝරා ඇති පාඨයක්, යතුරු පුවරුවේ ඕනෑම යතුරක් එබීමෙන් මකා දැමිය හැකි ය.
   (4) ඊ යතුරු (arrow keys) මගින් සැරිත්ත පාඨයක ඉහළට, පහළට, වමට හා දකුණට චලනය කළ හැකි ය.

13. පහත *A* හා *B* මගින් පරිගණක උපාංග දෙකක් දැක්වේ.



*A*



*B*

*A* හා *B* උපාංග සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) *A* සහ *B* උපාංග දෙක ම දත්ත ප්‍රතිදාන උපාංග වේ.
   (2) *A* සහ *B* උපාංග දෙක ම දත්ත ආදාන උපාංග වේ.
   (3) *A* දත්ත ආදාන උපාංගයක් වන අතර *B* දත්ත ප්‍රතිදාන උපාංගයක් වේ.
   (4) *A* දත්ත ප්‍රතිදාන උපාංගයක් වන අතර *B* දත්ත ආදාන උපාංගයක් වේ.

- පහත දැක්වෙන්නේ මිශ්‍ර පාසල් දෙකක තොරතුරු ඇතුළත් වදන් සැකසුම් මෘදුකාංගයක සකසන ලද වගුවකි. ඒ ඇසුරෙන් අංක **14** සහ **15** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| පාසල | භාෂා මාධ්‍යය | ශිෂ්‍ය සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | |
| *A* | සිංහල | | | |
| | දෙමළ | | | |
| *B* | සිංහල | | | |
| | දෙමළ | | | |
| එකතුව | | | | |

**14.** ඉහත වගුව සැකසීමට අවශ්‍ය පේළි ගණන හා තීරු ගණන පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) 4, 5 (2) 5, 7 (3) 7, 4 (4) 7, 5

**15.** ඉහත වගුවට භාෂා මාධ්‍ය දෙකම සහිත තවත් මිශ්‍ර පාසල් දෙකක ශිෂ්‍ය සංඛ්‍යා ඇතුළත් කළ යුතුව ඇත. එම තොරතුරු ඇතුළත් කිරීම සඳහා ඉහත වගුවට අලුතින්

(1) පේළි දෙකක් එක් කළ යුතු ය.
(2) තීරු දෙකක් එක් කළ යුතු ය.
(3) පේළි හතරක් එක් කළ යුතු ය.
(4) පේළි දෙකක් සහ තීරු දෙකක් එක් කළ යුතු ය.

**16.** නැවතුම් (tab) සහිත කෝදු තීරුවක (ruler bar) රූප සටහනක් පහත දැක්වේ.



*A* *B* *C* *D* *E*

මැදට නැවතුම, වමට නැවතුම, දකුණට නැවතුම සහ දශම තිතට නැවතුම පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) *A*, *B*, *E* සහ *C* (2) *A*, *E*, *B* සහ *C* (3) *C*, *B*, *E* සහ *D* (4) *D*, *E*, *B* සහ *C*

**17.** පහත ① හා ② හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

ආයතනයක සිටින ①...................... සහාය වන ලේකම්වරයෙකු වන අතර ②...................... විධාන දෙන ලේකම්වරයෙකු වේ.

(1) ප්‍රාදේශීය ලේකම්, සමාගම් ලේකම්
(2) පෞද්ගලික ලේකම්, පාසල් සංවර්ධන සමිතියේ ලේකම්
(3) පරිගණක ක්‍රියාකරු, අමාත්‍යාංශ ලේකම්
(4) සමාගම් ලේකම්, කළමනාකරණ සහකාර



**18.** මූසිකයේ (mouse) දකුණු බොත්තම click කිරීමෙන් පරිගණකයේ ආරම්භක තිරය මත (desktop) ලැබෙන මෙනුවෙහි New මත click කර Folder තේරීම මගින්,

(1) නව ගොනුවක් පරිගණක ආරම්භක තිරය මත නිර්මාණය වේ.
(2) නව ගොනු ගබඩාවක් පරිගණක ආරම්භක තිරය මත නිර්මාණය වේ.
(3) දත්ත ගබඩා කිරීමේ උපාංගයක නව ගොනු ගබඩාවක් නිර්මාණය වේ.
(4) පරිගණක තිරය මත තිබූ ගොනු ගබඩාවක් ඉන් ඉවත් වේ.

**19.** පරිගණක වදන් සැකසුම් මෘදුකාංගයක සකසා ඇති ලේඛනයක තෝරා ගත් පේළියක යටින් ඉරක් ඇඳීම සඳහා යතුරු පුවරුවේ කුමන යතුරු සංයෝජනය භාවිත කළ යුතු ද?

(1) ctrl+U (2) ctrl+Y (3) Alt+A (4) ctrl+~~abc~~

**20.** පරිගණක වදන් සැකසුම් මෘදුකාංගයේ කෝඩු තීරුවේ ඇති නිරූපක කිහිපයක් **X** තීරුවෙන් ද එම නිරූපකවලින් කෙරෙන කාර්ය **Y** තීරුවෙන් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1.  | ***A*** - ඡේදයක සියලු ම පේළි වම් පසින් ඇතුළට ගැන්වීම කළ හැකි ය. |
| 2.  | ***B*** - ඡේදයක මුල් පේළිය හැර, ඉතිරි පේළි සියල්ල ම වම් පසින් ඇතුළට ගැන්වීම කළ හැකි ය. |
| 3.  | ***C*** - ඡේදයක සියලු ම පේළි දකුණු පසින් ඇතුළට ගැන්වීම කළ හැකි ය. |
| 4.  | ***D*** - ඡේදයක මුල් පේළිය පමණක් වම් පසින් ඇතුළට ගැන්වීම කළ හැකි ය. |

ඉහත **X** තීරුවේ නිරූපක, **Y** තීරුවේ සඳහන් කාර්ය සමඟ ගැලපූ විට නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) ***A,D,B,C*** (2) ***B,D,C,A*** (3) ***C,D,B,A*** (4) ***D,B,C,A***

- පහත දැක්වෙන්නේ වදන් සැකසුම් මෘදුකාංගයේ ඇති නිරූපක කිහිපයකි. ඒවා ඇසුරෙන් අංක **21** සිට **23** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A B C D E F

**21.** ලේඛනයක මාතෘකාව පිටුව මැදට ගෙනැවිත් එය තද පැහැ ගැන්වීම සඳහා භාවිත කළ යුතු නිරූපක මොනවා ද?

(1) B සහ E (2) C සහ B (3) C සහ E (4) C සහ F

**22.** ලේඛනයක තෝරාගත් ඡේදයක් දෙපසින් එක කෙළින් පේළිගන්වා එම ඡේදයේ අකුරු වර්ණ ගැන්වීම සඳහා භාවිත කළ යුතු නිරූපක මොනවා ද?

(1) B සහ E (2) B සහ F (3) C සහ E (4) C සහ F

**23.** පහත වාක්‍යයේ යටින් ඉරි ඇඳි කොටස නිර්මාණය සඳහා යොදා ගත යුතු නිරූපක මොනවා ද?

සංචාරක කර්මාන්තයේ උන්නතිය උදෙසා **2024 වර්ෂයේ දී** රජය මගින් ගනු ලබන ක්‍රියාමාර්ග ඉතා උචිත බව ජනමාධ්‍ය විසින් පෙන්වා දී ඇත.

(1) B සහ A (2) B සහ D (3) C සහ D (4) D සහ E

**24.** පරිගණකයේ සකසා සංශෝධනයට යොමු කළ ලේඛනයක පේළියක් තනි ඉරකින් කපා, ලේඛනයේ වම් පසින් ∂/ යන සංකේතය යොදා තිබුණි. එම සංශෝධනය කිරීමට පහත කුමන නිරූපකය යොදාගත යුතු ද?

(1)  (2)  (3)  (4) 

**25.** කාර්යාලයක සංඥා හා සංකේත භාවිතයෙන් කෙරෙන සන්නිවේදනය සඳහා නිදසුනක් දැක්වෙන වරණය තෝරන්න.

(1) ෆැක්ස් පණිවුඩ යැවීම (2) ඊමේල් පණිවුඩ යැවීම
(3) සීනුව නාද කිරීම (4) දුරකථන ඇමතුම් ලබාදීම

**26.** ආයතන ප්‍රධානියාගේ පෞද්ගලික ලේකම් සතුවිය යුතු තාක්ෂණික කුසලතා පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පරිගණක සාක්ෂරතාව, ලඝු ලේඛන හැකියාව සහ යතුරු ලියන හැකියාව
(2) විශ්වාසවන්ත බව, සෞඛ්‍ය සම්පන්න බව සහ ඉවසිලිවන්ත බව
(3) කාර්යාල උපකරණ භාවිත කිරීමේ හැකියාව, යතුරු ලියන හැකියාව සහ නිසි කලට වැඩ කිරීම
(4) පරිගණක සාක්ෂරතාව, විවිධ භාෂා හැසිරවීමේ හැකියාව සහ විශ්වාසවන්ත බව

**27.** කාර්යාලයක ලිපිගොනු, ගොනුගත කිරීමේ නූතන ක්‍රමයක් වන්නේ,

(1) පැතලි ගොනු ක්‍රමය ය. (2) පෙට්ටි ගොනු ක්‍රමය ය.
(3) ඩොකට්ටු ගොනු ක්‍රමය ය. (4) කොන්සර්ටිනා ගොනු ක්‍රමය ය.


**28.** දාතමානුකූල වර්ගීකරණය අනුව වර්ගීකරණය කළ යුතු ලිපිගොනු තෝරන්න.
(1) පාසලකට ඇතුළත් කරගත් ශිෂ්‍යයින්ගේ ලිපිගොනු
(2) ආයතනයකට මුදල් ලැබීම් සම්බන්ධ ලිපිගොනු
(3) රෝහලකට රෝගීන් ඇතුළත් කිරීමේ ලිපිගොනු
(4) කාර්යාලයක සේවය කරන සේවකයින්ගේ පෞද්ගලික ලිපිගොනු

**29.** කාර්යාලයක භාවිත වන උපකරණ, ලී බඩු හා ලිපිද්‍රව්‍ය සඳහා නිදසුන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මේස, A4 කඩදාසි, පෑන් හා පැන්සල්
(2) ඡායා පිටපත් යන්ත්‍ර, මුද්‍රණ තීන්ත, මේස හා පුටු
(3) ෆැක්ස් යන්ත්‍ර, ලිපිගොනු, ගණක යන්ත්‍ර
(4) පරිගණක, මේස, ලියන කඩදාසි

**30.** පහත දැක්වෙන්නේ පැතුරුම්පත් සම්බන්ධ ප්‍රකාශ දෙකකි.
*A* - පැතුරුම්පතක ඇති කෝෂයක් නම් කරනුයේ පළමුව තීරුවේ නාමය ද දෙවනුව පේළියේ අංකය ද යෙදීමෙනි.
*B* - A2*3 Enter මගින් A2 කෝෂයේ ඇති අගය තුනෙන් ගුණ වී පිළිතුර ලැබේ.
ඉහත *A* සහ *B* සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) *A* හා *B* ප්‍රකාශ දෙක ම සත්‍ය වේ.
(2) *A* හා *B* ප්‍රකාශ දෙක ම අසත්‍ය වේ.
(3) *A* ප්‍රකාශය සත්‍ය වන අතර *B* ප්‍රකාශය අසත්‍ය වේ.
(4) *A* ප්‍රකාශය අසත්‍ය වන අතර *B* ප්‍රකාශය සත්‍ය වේ.

**31.** පහත ප්‍රකාශය සම්බන්ධව නිවැරදි වරණය තෝරන්න.
පැතුරුම්පතක එක්තරා කෝෂයක =sum(A1:A5) සූත්‍රය ලියා Enter කරන ලදි.
(1) A1 කෝෂයේ ඇති අගයේ හා A5 කෝෂයේ ඇති අගයේ එකතුව ලැබේ.
(2) A1 කෝෂයේ සිට A5 කෝෂය තෙක් ඇති සියලුම කෝෂවල ඇති අගයන්ගේ එකතුව ලැබේ.
(3) A1 කෝෂයට හා A5 කෝෂයට දත්ත ඇතුළත් කිරීමට අවස්ථාව ලැබේ.
(4) A1 + A2 + A3 + A4 + A5 Enter මගින් ද එම පිළිතුර ම ලබා ගත හැකි ය.

- පහත දැක්වෙන්නේ වදන් සැකසුම් මෘදුකාංගයේ හා පැතුරුම්පත් මෘදුකාංගයේ දැකිය හැකි නිරූපක කිහිපයකි. එම නිරූපක භාවිතයෙන් අංක **32** සහ **33** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



*A* *B* *C* *D* *E*

**32.** පැතුරුම්පත් මෘදුකාංගයේ පමණක් දැකිය හැකි නිරූපකය කුමක් ද?
(1) *A* (2) *B* (3) *C* (4) *D*

**33.** පැතුරුම්පත් මෘදුකාංගයේ හෝ වදන් සැකසුම් මෘදුකාංගයේ හෝ ලියා ඇති පාඨයක අකුරුවල වර්ණය වෙනස් කළ හැකි නිරූපකය කුමක් ද?
(1) *A* (2) *B* (3) *C* (4) *E*





**34.** පැතුරුම්පතක AZ තීරුවට දකුණු පසින් ඇති තීරුවේ නාමය කුමක් ද?
(1) AA (2) ZA (3) BA (4) AZA

**35.** පැතුරුම්පතක E2 කෝෂයේ සිට E5 කෝෂය තෙක් වූ සියලුම කෝෂවල ඇති අගයන්ගේ එකතුව E6 කෝෂයට ලබා ගත යුතු ය. E6 කෝෂයට නිවැරදි අගය ලබා **නොදෙන** සූත්‍රය කුමක් ද?
(1) =E2 + E3 + E4 + E5 ⟶ Enter
(2) =E2 : E5 ⟶ Enter
(3) =sum(E2 : E5) ⟶ Enter
(4) =sum (E2 + E3 + E4 + E5) ⟶ Enter

- පහත දැක්වෙන්නේ පැතුරුම්පතකින් උපුටාගත් කොටසකි. ඒ ඇසුරෙන් අංක **36** සහ **37** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | 67 | | |
| 3 | | 78 | | |
| 4 | | 45 | | |
| 5 | | 56 | | |
| 6 | | 246 | | |
| 7 | | | | |

**36.** ඉහත පැතුරුම්පතේ එකතුව සඳහන් කෝෂයේ (B6) ඉහළින් තනි ඉරක් හා පහළින් තද පැහැති ඉරක් ඇඳ ඇත. එය සැකසීමට භාවිත කර ඇති නිරූපකය කුමක් ද?

(1)   (2)   (3)   (4) 

**37.** B6 කෝෂයේ දැක්වෙන අගයෙහි සාමාන්‍යය ගණනය කර C6 කෝෂයේ දැක්විය යුතු ය. C6 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය කුමක් ද?

(1) =B6/4  (2) =B6/5  (3) =B2:B5/4  (4) =(B2:B5)/4

**38.** ලඝු ලේඛකයකුගේ කුසලතාවක් වන්නේ,

(1) කතා කරන වේගයෙන් ම එම කථනය, ලඝුලේඛන ක්‍රමයක් භාවිත කොට නිවැරදිව ලිවීමයි.
(2) තමාට ඇසෙන සියලුම ශබ්ද ලඝුලේඛනයෙන් ලිවීමට ඇති හැකියාවයි.
(3) ලඝුලේඛනයෙන් ලිවීම වෙනුවට කථනය සිංහල දිගුහනින් ලිවීමයි.
(4) ලඝුලේඛනයේ මූලික පාඩම් කිහිපයක් පමණක් හදාරා එය පුහුණුවීමයි.

**39.** සිංහල ලඝුලේඛන ක්‍රම වන ලෝරන්ස් සහ කැන්ටර් ලඝුලේඛන ක්‍රමයන් හි පොදු ලක්ෂණයක් වන්නේ,

(1) මූලික ව්‍යංජන රේඛාක්ෂර සමග පදාන්ත 'අ' ස්වරය සංයෝග වී තිබීමයි.
(2) මූලික ව්‍යංජන රේඛාක්ෂර සමග පදාන්ත 'ආ' ස්වරය සංයෝග වී තිබීමයි.
(3) මූලික ව්‍යංජන රේඛාක්ෂර සමග පදාන්ත 'ඒ' ස්වරය සංයෝග වී තිබීමයි.
(4) මූලික ව්‍යංජන රේඛාක්ෂර සමග පදාන්ත 'ඉ' ස්වරය සංයෝග වී තිබීමයි.

**40.** ලඝුහනින් ලිවීම පිළිබඳ රීති දෙකක් පහත දැක්වේ.

*A* – ලඝුහන සනකර ලිවීම සඳහා ලඝුහන මත දෙවරක් ලිවිය යුතු ය.
*B* – රේඛා අක්ෂරයක් ලියා අවසන් වන තුරු පැන්සල ඉවතට නොගත යුතු ය.

ඉහත ප්‍රකාශවලින්,

(1) *A* ප්‍රකාශය නිවැරදි වන අතර *B* ප්‍රකාශය වැරදි ය.
(2) *A* ප්‍රකාශය වැරදි වන අතර *B* ප්‍රකාශය නිවැරදි ය.
(3) *A* හා *B* ප්‍රකාශ දෙකම නිවැරදි ය.
(4) *A* හා *B* ප්‍රකාශ දෙකම වැරදි ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 | S | I, II

66263

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

**භූගෝල විද්‍යාව I, II**
புவியியல் I, II
Geography I, II

## භූගෝල විද්‍යාව II

✳ මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
✳ I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
✳ II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
✳ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

### I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක **8**) යොදා ගන්න.

- අංක (i) සිට (iv) තෙක් ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) Ⓐ - Ⓑ රේඛාවෙන් දක්වා ඇති බෑවුම කුමක් ද?
(ඒකාකාර බෑවුම / උත්තල බෑවුම / අවතල බෑවුම) (ලකුණු 01 යි)

(ii) Ⓒ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(ගල් තලාව / ලඳු කැලෑව / වනාන්තරය) (ලකුණු 01 යි)

(iii) Ⓓ අක්ෂරයෙන් දැක්වෙන අගයෙන් අදහස් වන්නේ කුමක් ද?
(දේශාංශ රේඛා / අක්ෂාංශ රේඛා / ඛණ්ඩාංක රේඛා) (ලකුණු 01 යි)

(iv) සිතියම් ප්‍රදේශයේ නිරිත දිග පිහිටි ප්‍රධාන ගංගාව ඔස්සේ විහිදෙන පරිපාලන මායිම කුමක් ද?
(දිස්ත්‍රික් / ග්‍රාම නිලධාරී කොට්ඨාස / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස) (ලකුණු 01 යි)

(v) ඔබ සිතියම් ප්‍රදේශයේ දකුණු මායිමේ සිට උතුරු මායිම දක්වා දුම්රියෙන් ගමන් කරන්නේ නම් ඔබ පසුකරන ප්‍රදේශයේ වැඩි වශයෙන් ම ව්‍යාප්ත වී ඇති ව්‍යාපාරික බෝගය කුමක් ද? (ලකුණු 01 යි)

(vi) Ⓟ අක්ෂරයෙන් දක්වා ඇති චතුරස්‍රාකාර ප්‍රදේශය තුළ සම්මත සංකේත මගින් නිරූපණය කෙරෙන පොදු සේවා සපයන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (vii) සහ (viii) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් '**නි**' යන්න ද වැරදි නම් '**වැ**' යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(vii) සිතියම් ප්‍රදේශයේ පිහිටා ඇති හෙල්වැටි වයඹ-ගිණිකොණ දිශානුගතව විහිදේ. (ලකුණු 01 යි)
(viii) සිතියම් ප්‍රදේශය තෙත් කලාපයට අයත් බවට සාධක ඇත. (ලකුණු 01 යි)
(ix) Ⓟ අක්ෂරයෙන් දක්වා ඇති කොටු කළ ප්‍රදේශයෙහි විශාලත්වය වර්ග කිලෝමීටර කීය ද? (ලකුණු 01 යි)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක **9**) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) ඇල්ප්ස් කඳුවැටිය - Ⓐ, Ⓑ, Ⓒ
(ii) පරානා පැරගුවේ ගංගාව - Ⓓ, Ⓔ, Ⓕ
(iii) ග්‍රේට්ස්ලේව් විල - Ⓟ, Ⓠ, Ⓡ
(iv) තායිවාන් දූපත - Ⓢ, Ⓣ, Ⓤ
(v) පර්ත් නගරය - Ⓧ, Ⓨ, Ⓩ

(ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක 9) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) මහනුවර දිස්ත්‍රික්කය - Ⓐ, Ⓑ, Ⓒ

(ii) අම්බලන්තොට වී පර්යේෂණායතනය - Ⓓ, Ⓔ, Ⓕ

(iii) කන්කසන්තුරෙයි වරාය - Ⓙ, Ⓚ, Ⓛ

(iv) සිංහරාජ වනාන්තරය - Ⓜ, Ⓝ, Ⓞ

(v) සේනානායක සමුද්‍රය - Ⓦ, Ⓧ, Ⓨ (ලකුණු 05 යි)

## II කොටස

**2.** (i) පාෂාණවල ඝනත්වය, සංයුතිය හා පිහිටීම අනුව පෘථිවි කබොල බෙදෙන කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පෘථිවි ප්‍රාවරණයෙහි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා පෘථිවි කබොල ප්‍රයෝජනවත් වන ආකාරය පහත ශීර්ෂ යටතේ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(a) කෘෂිකර්මය

(b) කර්මාන්ත

(c) බලශක්තිය (ලකුණු 05 යි)

**3.** (i) පහත දැක්වෙන එක් එක් බෝගය වගා කිරීම සඳහා යෝග්‍ය පස් වර්ගය ලියා දක්වන්න.

(a) තිරිඟු

(b) වී (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයෙහි වී වගාව සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිත පහත සඳහන් ක්‍රියාකාරකම් හේතුවෙන් හටගන්නා **අහිතකර** ප්‍රතිඵල **එක බැගින්** ලියන්න.

A - කෘත්‍රිම පොහොර භාවිතය

B - කෘමිනාශක හා වල්නාශක භාවිතය

C - නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය

(b) ඔබ ඉහත (iii) (a) හි සඳහන් කළ **එක්** අහිතකර ප්‍රතිඵලයක් තෝරාගෙන එහි බලපෑම අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** (i) කාර්මික නිෂ්පාදනයක් ලෙස යකඩ හා වානේ වැදගත්වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන රටවල් තුනෙහි යකඩ හා වානේ නිෂ්පාදනය කෙරෙන මධ්‍යස්ථාන **එක බැගින්** නම් කරන්න.

(a) ඉන්දියාව

(b) චීනය

(c) ඇමෙරිකා එක්සත් ජනපදය (ලකුණු 03 යි)


(iii) ලෝකයේ රටවල් අතර සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව වැදගත්වීමට හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[හත්වැනි පිටුව බලන්න.

**5.** (i) ලෝකයේ අධිකතම ජනසංඛ්‍යාවක් වාසය කරන රටවල් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත දක්වා ඇති සිතියම් කොටසෙහි ජනහීන කලාප තුනක් Ⓐ , Ⓑ හා Ⓒ යනුවෙන් දක්වා ඇත.

ඒ එක් එක් කලාපය ජනහීන වීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන හේතුව කුමක්දැයි ලියා දක්වන්න. (ලකුණු 03 යි)




(iii) ශ්‍රී ලංකාවේ අසම ජන ව්‍යාප්තියක් ඇතිවීමට ඉවහල් වී ඇති හේතු **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**6.** (i) පහත (a) සහ (b) සඳහා ගැළපෙන ස්වාභාවික සම්පත් **එක බැගින්** නම් කරන්න.

(a) ආයාසයෙන් ලබාගන්නා සම්පත්

(b) නිරායාසයෙන් ලැබෙන සම්පත් (ලකුණු 02 යි)

(ii) ආග්නේය පාෂාණවලින් ලබා ගත හැකි ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ වන ජීවීන් මුහුණපාන ගැටලු **තුනක්** නම් කර ඒවා විසඳා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

**7.** (i) මානුෂ සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා යොදා ගන්නා නිර්ණායක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉවහල්වන ආකාරය පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(a) අධ්‍යාපනය

(b) සෞඛ්‍යය

(c) බැංකු හා මූල්‍ය ගනුදෙනු (ලකුණු 05 යි)

**8.** (i) ලෝකයේ ලැව්ගිනි බහුලව හටගන්නා රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ලැව්ගිනි හටගැනීමට බලපාන ස්වාභාවික හේතු **දෙකක්** ද මානුෂ හේතු **එකක්** ද වෙන් වෙන් ව ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(iii) දේශගුණික වෙනස්කම් අවම කර ගැනීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

විභාග අංකය / சுட்டெண் / Index Number ..........................................

66263

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் / For Examiner's Use Only

**1.** (අ) /(அ) /(a)

(i) ..............................................................................................

(ii) ..............................................................................................

(iii) ..............................................................................................

(iv) ..............................................................................................

(v) ..............................................................................................

(vi) ● ..............................................................................................

● ..............................................................................................

(vii) ..............................................................................................


(viii) ..............................................................................................

(ix) ..............................................................................................

/ 10

මෙහි කිසිවක් නොලියන්න


(ආ) /(ஆ) /(b)




(i)
(ii)
(iii)
(iv)
(v)

5

(ඉ) /(இ) /(c)




(i)
(ii)
(iii)
(iv)
(v)

5

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும். For Examiner's Use Only.

1. (අ) (அ) (a) $\frac{}{10}$ (ආ) (ஆ) (b) $\frac{}{5}$ (ඉ) (இ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]


66263

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 II

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
## General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

### භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II



PAST PAPERS WIKI